# ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
## ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ විද්‍යාගාර ඕර්ඩලි III තනතුර සඳහා
## බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම - 2023

1. ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ විද්‍යාගාර ඕර්ඩලි III තනතුර සඳහා බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

2. ආණ්ඩුවේ රස පරීක්ෂක විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පදනම් කරගෙන සුදුසු අය තෝරාගනු ලැබේ.

3. මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය ආණ්ඩුවේ රස පරීක්ෂක විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් 2023 නොවැම්බර් මාසය තුළ ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ දී පවත්වනු ලැබේ.

4. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය:

   දැනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව 03 කි. ඒ සඳහා අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන අපේක්ෂකයන්ට ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා උපරිම ලකුණු අනුපිළිවෙලින් ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ විද්‍යාගාර ඕර්ඩලි III තනතුරට බඳවා ගැනීම කරනු ලැබේ.

5. අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්:

   5.1 අධ්‍යාපන සුදුසුකම්:
   අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබිය යුතුය.

   5.2 වෘත්තීය සුදුසුකම්:
   විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

   5.3 පළපුරුද්ද:
   විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

   5.4 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අයදුම්කරුවන් අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට වැඩි නොවිය යුතුය.

   5.5 අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

   5.6 අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා ශාරීරික, මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

   5.7 සෑම අයදුම්කරුවකු ම තනතුරකට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

5.8 අදාළ මූලික සුදුසුකම් සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත.

ඉල්ලුම් කළ යුතු පිළිවෙල

6. මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍ර ප්‍රකාරව ඒ 4 ප්‍රමාණයේ කඩදාසියේ එක් පැත්තක් ප්‍රයෝජනයට ගනිමින් සකස් කර ගත් ඉල්ලුම් පත්‍රය තම අත් අකුරින්ම පිරවිය යුතුය. නිසි ලෙස සම්පූර්ණ කළ අයදුම්පත් 2023.10.31 දින හෝ දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, නො.31, ඉසුරු මාවත, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට එවිය යුතු අතර අයදුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ 'විද්‍යාගාර ඕර්ඩලි III තනතුර - ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව' යන්න සඳහන් කළ යුතුය. දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉල්ලුම්පත් එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන හෝ නිසි ලෙස සම්පූර්ණ නොකරන ලද හෝ ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර ඉල්ලුම් පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ඉල්ලුම් පත්‍රයේ අංක 01 සිට 07 තෙක් පළමුවන පිටුවට ද ඉතිරිය 2/3 වන පිටු වලට ද ඇතුළත් වන ලෙස සකස් කළ යුතු අතර සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය, ගැසට් නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුනහොත් ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප වනු ඇත.

7. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවා සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බව අනාවරණය වුවහොත් එම අය පත්වීම් ලබා දීම සඳහා නුසුදුස්සකු ලෙස සලකනු ලැබේ.

8. මෙම නිවේදනයෙන් අනාවරණය නොවන කරුණු පිළිබඳව හා පත්වීම් ලබා දීමේ අවසාන තීරණ ගැනීමේ බලය ආණ්ඩුවේ රස පරීක්ෂක සතුය.

9. අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සමාදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු රුපියල් 2,37,060/- කට වැඩි වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

10. තේරීම් පරිපාටිය:

10.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ද පහත පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අමතර අධ්‍යාපන සුදුසුකම් | 15 | අදාළ නොවේ |
| 2. පළපුරුද්ද | 50 | |
| 3. වෘත්තීය සුදුසුකම් | 10 | |
| 4. භාෂා ප්‍රවීණතාවය | 10 | |
| 5. පරිගණක හැකියාව | 10 | |
| 6. සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලබන කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

සුදුසුකම් සම්පූර්ණ කර ඇති සහ උපරිම ලකුණු ලබා ගත් අපේක්ෂකයින් තිදෙනා (03) තෝරා ඔවුන් විද්‍යාගාර ඕර්ඩලි III තනතුරට පත් කරනු ලැබේ.

11. පහත සඳහන් ලියවිලි අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට අපේක්ෂකයන්ට නියම කෙරෙනු ඇත.
   i) ලබා ගෙන ඇති උසස්ම අධ්‍යාපනික සහ තාක්ෂණික සහතික පත්‍ර,
   ii) රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් නිකුත් කරනු ලබන උප්පැන්න සහතිකය,
   iii) මෑතකදී ලබාගත් චරිත සහතික තුන (03) ක්,
   iv) මාස 06 ක කාලයක් තුල ලබා ගත් පොලිස් වාර්තාවක්

12. වෛද්‍ය පරීක්ෂණය:
තෝරා ගත් අයදුම්කරුවන් තමන් ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු වස් වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර වෛද්‍ය පරීක්ෂණයේදී අයෝග්‍ය බව පෙනී යන අපේක්ෂකයින් නුසුදුස්සන් වනු ඇත.

13. වැටුප් ක්‍රමය:
(රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හා ඊට අදාළ සංශෝධන වලට අනුව)
විද්‍යාගාර ඕර්ඩලි III ශ්‍රේණිය PL-1-2016 රු.24,250-10x250-10x270-10x300-12x330-36410/=

14. සේවා කොන්දේසි:

14.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත්විය යුතුවේ. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

14.2 තෝරාගනු ලබන්නන් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, රෙගුලාසි හා රජය මඟින් දැනට

නිකුත් කර ඇති හා කලින් කල නිකුත් කරනු ලබන වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට ද යටත් විය යුතුය.

14.3 රාජ්‍ය භාෂා නොවන භාෂා මාධ්‍යයකින් බඳවාගත් නිලධාරියකු පත් කළ දින සිට අවුරුදු 03 ක් ඇතුළත රාජ්‍ය භාෂා පරීක්ෂණයෙන් සමත් විය යුතුය. නියමිත කාලය තුළ මෙම පරීක්ෂණයෙන් සමත්වීමට අපොහොසත් වීම ඊළඟ වැටුප් වර්ධකය විලම්බනය වීමට හේතු වනු ඇත.

14.4 ස්ථිර පත්වීමේ දින සිට වසර 05 ක් ඇතුළත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 (IV) හි දැක්වෙන පරිදි තම තනතුරට අදාළ වන මට්ටමේ දෙවන රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු වේ. අදාල කාලය තුළ එම ප්‍රවීණතාවය ලබා ගැනීමට අපොහොසත් වුවහොත් එම ප්‍රවීණතාවය ලබා ගන්නා තුරු වැටුප් වර්ධක නතර කෙරේ.

15. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බල පැවැත්වන්නේය.

10/10/2023 දින,
ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
නො.31, ඉසුරු මාවත,
පැලවත්ත,
බත්තරමුල්ල.

දීපිකා සෙනෙවිරත්න
ආණ්ඩුවේ රස පරීක්ෂක

ඩී. සෙනෙවිරත්න
ආණ්ඩුවේ රස පරීක්ෂක
ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
නො. 31, ඉසුරු මාවත,
පැලවත්ත, බත්තරමුල්ල.